# කම්මැලි කූඹියා



යූ. ජී. උසඳි සෙහන්සා රණවීර

# කම්මැල කඹීයා

**යූ. ජී. උසඳි සෙහන්සා රණවීර**
මහාමායා බාලිකා විදුහල
මහනුවර

# කම්මැලි කූඹියා

© උසඳි සෙහන්සා

සියලුම හිමිකම් ඇවිරිණි

ප්‍රකාශිත දිනය - 2025/02/22

කර්තෘ අයිතිය සතු ය.

ISBN: 978-624-208-830-0

කතාව සහ සිතුවම්
යූ. ජී. උසඳි සෙහන්සා රණවීර

කර්තෘගේ වෙනත් කෘති

කුරුලු පවුලේ හපන්කම (2023)
මගේ සුරතල් ටුංකු (2025)

# පිදුම

මහාමායා බාලිකා විද්‍යාලයේ
සියලුම ගුරු මෑණිවරුන්ට
සහ පියවරුන්ට ද
මාගේ දෙමව්පියන්ට ද

මෙම පොත නිර්මාණය කර ගැනීම
සඳහා සහය දුන් සියලුම දෙනාට
පුද කර සිටිමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසා ය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙය යි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

**ශෂිකලා සේනාධීර**

**විදුහල්පතිනිය**

**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**

එකමත් එක කාලයක එක කැලයක පුංචි කූඹි ගුලක් තිබුණා. ඒ කූඹි ගුලේ කම්මැලි පුංචි කූඹියෙක් හිටියා. එයාට තනියම වැඩපළ කරගන්න පුළුවන් වුණාට එයා කම්මැලි නිසා තනියම වැඩපළ කර ගන්නේ නෑ.

අනිත් කූඹියෝ හැමෝම උදෙන් ම අවදි වුණාට එයා අවදි වෙන්නේ දවල් වෙලා. එයාගේ අම්මා කතා කළත් එයා නෙවෙයි නැගිට්න්නේ.



ඉතින් ඒ කම්මැලි පුංචි කූඹියා
අනිත් කූඹියෝ එක්ක
සහයෝගයෙන් වැඩ කරන්නෙත්
නෑ. ඉතින් එයා කාටවත් උදව්
කරන්නේ නැති නිසා එයාට
යාළුවෝ කවුරුත් හිටියේ නෑ. එයා
හැම වෙලාවේ ම හිනා නොවී
තරහෙන්මයි ඉන්නේ. එයාට
තිබුණේ නපුරු මූණක්. කවුරුත්
එයාට ආසා නෑ



එක දවසක් මේ පුංචි කූඹියා
කැලේ ඇවිදිමින් සිටිය දී ලොකු
වැස්සක් වහින්න පටන් ගත්තා.
කූඹියා තෙමිලා එයාට ගුලට යන්න
බැරි වුණා. එයාගේ කකුල
පැටලිලා වැටිලා තුවාලත් වුණා.

එයා උදව් ඉල්ලලා
කෑ ගැසුවා. ඒත් ඒ වෙලාවේ
එයාට හිතුණේ එයා කාටවත් උදව්
කළේ නැති නිසා කවුරුත් එයාට
උදව් කරන්නේ නැති වෙයි කියලා.



ඒත් ඒ හැමදේම අමතක කරලා අනිත් කූඹියෝ මෙයාට උදව් කරන්න ආවා. ඊට පස්සේ කූඹියාව ගුලට එක්ක ගෙන ගියා.

එදා ඉදන් ඒ පුංචි කූඹියා කම්මැලි වුණේ නෑ. කූඹියා කඩිසර ව කටයුතු කරලා හැම කෙනෙකුට ම උදව් කරමින් සහයෝගයෙන් කටයුතු කළා.



ඉතින් පුංචි යාළුවනේ, අපිට
මේ කතාවෙන් ඉගෙන ගන්න
තියෙන ආදර්ශය තමා
"කම්මැළි නොවී කඩිසර ව
වැඩ කරමින් සියලු දෙනා
සමග සහයෝගයෙන් කටයුතු
කිරීම" යි.

**නිමි.**



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීම යි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙය යි. මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතු ය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම යි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකි ය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දූරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන...

**මෙයට,**
**සෙනෙවිරත්න මහලේකම්,**
**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක**